// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1376/9 – 2005 ජනවාරි 19 වැනි බදාදා – 2005.01.19

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.1 1/80(II).

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍ය.

2005 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මෙම නියෝග ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග 2005 වශයෙන් හඳුන්වනු ලැබිය හැකිය.

02. කිසිම පුද්ගලයෙකු විසින්, ඇසුරුමක හෝ බහාලුවක අඩංගු කුමන හෝ ආහාරයක්, එම ඇසුරුම හෝ බහාලුව මෙම නියෝගවලට අනුව ලේබල්කර නොමැති නම් එය විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම පිණිස තබාගැනීම ප්‍රවාහනය කිරීම හෝ විකිණීම සඳහා ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

එසේ වුව ද, ගැනුම්කරු විසින් ඉල්ලා සිටින ස්වභාවයේ, තත්ත්වයේ, ප්‍රමාණයේ, සම්භවයේ සහ වර්ගයේ සහ ඔහු ඉදිරියේ කිරනු ලබන, ගණන් කරනු ලබන හෝ මනිනු ලබන ස්වභාවයේ ආහාරයක් සම්බන්ධයෙන් නම්, එම ආහාරය අඩංගු වන ඇසුරුම සඳහා මෙම නියෝග අදාළ නොවිය යුතු ය.

එසේ වුව ද තවදුරටත් නිෂ්පාදිත දිනය සහ කල් ඉකුත්වන දින ද ඇතුළත් විස්තර සහිත බිත්තර අසුරා ඇති විනිවිද පෙනෙන "බ්ලිස්ටර්" ඇසුරුම්වලට මෙම නියෝග අදාළ නොවිය යුතුය.

03. (1) ඇසුරුමක හෝ බහාලුවක අඩංගු ආහාරය සම්බන්ධයෙන් විස්තර ප්‍රකාශ දැක්වෙන ලේබලයක් එම ඇසුරුමේ හෝ බහාලුවේ තිබිය යුතු අතර, එය පැහැදිලිව හා ප්‍රකටව විදහා දැක්විය යුතු ය.

1A – CM 007523 – 2,000 (2007/05)

(2) ලේබලය, ආහාර අඩංගු ඇසුරුමේ හෝ බහාලුවේ ප්‍රධාන රාමුවේ නොමැකෙන ලෙස මුද්‍රණය කොට හෝ පින්තාරු කොට හෝ අලවා තිබිය යුතු ය.

(3) නිෂ්පාදකයකු හෝ ඇසුරුම්කරු විසින් ඇසුරුමේ මුද්‍රණය කරන ලද, සටහන් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද මුල් නිෂ්පාදිත දිනය, ඇසුරුම් කිරීමේ හෝ කල් ඉකුත්වීමේ දිනය දුර්වර්ණ කිරීම, විකෘති කිරීම, මකා දැමීම හෝ විනාශ කිරීම කිසිවකු විසින් නොකළ යුතු ය.

(4) ආහාර අඩංගු එවැනි ඇසුරුමක හෝ බහාලුවක ලේබලය භාෂා තුනෙන් එක් භාෂාවකින් පමණක් ප්‍රධාන රාමුවේ අලවා ඇති විටක සහ රෙගුලාසිවලට අනුකූලව අතිරේක ලේබලයක් අනිකුත් එක භාෂාවකින් හෝ භාෂා දෙකින් ම ද ආහාරය අඩංගු ඇසුරුමේ හෝ බහාලුවේ වෙනත් රාමුවක, ප්‍රකටව පෙනෙන ලෙස පැහැදිලි ඝණ අකුරින් නොමැකෙන ලෙස මුද්‍රණය කොට හෝ පින්තාරුකොට අලවා ඇති අවස්ථාවක මේ නියෝගවල නියමයන්ට අදාල බවට සෑහීමට පත්වීම සඳහා එය ප්‍රමාණවත් විය යුතු ය.

එසේ වුව ද, මෙම අතිරේක ලේබලයක් ඇලවීම සිදු කරන්නේ නම් නිෂ්පාදිත දිනය ඇසුරුම් කළ හෝ කල් ඉකුත්වන දිනය සහ පනත යටතේ නියම කර ඇති අනෙකුත් අනිවාර්ය තොරතුරු ආදිය ඒ ලේබලයේ ඇතුළත් වේ නම් එම ලේබලය ඇලවීමේ දී නිෂ්පාදකයා හෝ ඇසුරුම්කරු විසින් ප්‍රකාශ කිරීමට නියමිත මුල් නිෂ්පාදිත දිනය, ඇසුරුම් කළ දිනය, කල් ඉකුත්වන දිනය සහ අනෙකුත් අනිවාර්ය තොරතුරු දුර්වර්ණ කිරීම, විකෘති කිරීම, මකා දැමීම හෝ විනාශ කිරීම හෝ යන කරුණු සිදු නොවන ආකාරයට ඇලවිය යුතු ය.

04. (1) ඇසුරුමේ හෝ බහාලුවේ ප්‍රධාන රාමුවේ පහත සඳහන් ප්‍රකාශයන් සඳහන් විය යුතු ය.

(අ) අවම වශයෙන් භාෂා තුනෙන් කුමන හෝ භාෂා දෙකකින් පමණක් බහාලුවේ අඩංගු ද්‍රව්‍ය පිළිබඳ පොදු නාමය පැහැදිලි ඝන අකුරින්,

(ආ) වර්ග නාමයක් හෝ වෙළඳ නාමයක් තිබේ නම්, භාෂා තුනෙන් කුමන හෝ භාෂා එකකින් හෝ වැඩි ගණනකින් මහජනයා නොමඟ නොයන අයුරින් සඳහන් කළ යුතු ය.

(ඇ) ඇසුරුමේ හෝ බහාලුවේ ශුද්ධ අන්තර්ගතය, ඝන ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් නම්, "g" හෝ "Kg" වශයෙන් ද, ද්‍රව සම්බන්ධයෙන් නම් "ml" හෝ "l" වශයෙන් ද, ද්‍රව මාධ්‍යයෙන් අසුරා ඇත්නම්, දියර ඉවත් කළ ශුද්ධ බර "g" හෝ "Kg" වශයෙන් ද, ජාත්‍යන්තර සංකේත ඇසුරෙන් සඳහන් කළ යුතු ය.

එසේ වුව ද, පොදු නාමය වෙනුවට මෙහි 1 වැනි උපලේඛනයෙහි දක්වා ඇති ආකාරයට වෙනත් කවර හෝ නමක් ආදේශ කළ හැකි ය.

(2) පහත සඳහන් විස්තර ප්‍රකාශ භාෂා තුනෙන් කවර හෝ එක් භාෂාවකින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් කුමන හෝ රාමුවක දැක්විය යුතු ය.

(අ) මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරන ලද කුමන හෝ අවසරලත් ආහාර ආකලන ද්‍රව්‍ය නම් වශයෙන් හෝ ජාත්‍යන්තර අංක යෙදීමේ "අයිඑන්එස්" (INS) ක්‍රමයෙන්,

(ආ) ගබඩා කිරීම පිළිබඳව සහ භාවිතා කිරීම පිළිබඳව උපදෙස් ඇත්නම් එම උපදෙස්,

(ඇ) ශ්‍රී ලංකාව තුළ වූ නිෂ්පාදකයාගේ සහ ඇසුරුම්කරුගේ හෝ බෙදාහරින්නාගේ නම සහ ලිපිනය,

(ඈ) භාණ්ඩ අංකය හෝ සංකේත අංකය හෝ රහස් සංකේත සටහන,

(ඉ) කාලය ඉකුත්වීමේ දිනය.

(ඊ) නිෂ්පාදනය කළ දිනය.

(උ) ආහාර තොග වශයෙන් ආනයනය කොට නැවත ඇසුරුම් කරනු ලබන විටක නිෂ්පාදනය කළ දිනය සහ යළි ඇසුරුම් කරන ලද දිනය.

(ඌ) එවැනි ආහාරයක අඩංගු සංඝටක වල සම්පූර්ණ ලැයිස්තුවක් ඒවා සඳහා භාවිතා කරනු ලබන පොදු නම් වලින්, යොදා ගනු ලබන ප්‍රමාණයන්ට අනුව අවරෝහණය ක්‍රමයට.

(එ) ආනයනය කරන ලද ආහාර සම්බන්ධයෙන් එම ආහාර නිෂ්පාදනය කළ රට.

(ඒ) මෙම නියෝග යටතේ දක්වා ඇති වෙනත් ප්‍රකාශයන්.

එසේ වුව ද, දියර කිරි සහ කාබනීකරණය කළ (වාතිත) මෘදුපාන අඩංගු බෝතල්වල කාලය ඉකුත්වන දිනය බෝතල් මූඩියේ සඳහන් කළ හැකිවන අතර, ආහාර අඩංගු ලෝහ භාජන සම්බන්ධයෙන් වන විට කාලය ඉකුත්වන දිනය නොමැකෙන ලෙස එම භාජනයේ මුදුනේ හෝ පතුලේ ඇති පියන් මත සඳහන් කළ හැකි ය.

එසේම තවදුරටත් සම්පූර්ණ තොග ඇසුරුම්වල ඇති සීනි, තේ කොළ, ධාන්‍ය සහ ඇට වර්ග, අලුත් එළවළු, පළතුරු, අල බතල සහ පෙති කපන ලද පාන් හැර අනෙකුත් පාන් සඳහා කාලය ඉකුත්වීමේ දිනය අවශ්‍ය නොවේ.

(3) බර ග්‍රෑම් 25 නොඉක්මවන ඇසුරුම් කළ ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් එම ආහාර සිරිත් පරිදි ගැනුම්කරුට විකුණනු ලබන නිමුදන ඇසුරුම හෝ බඳුන මෙම නියෝගවලට අනුව ලේබල් කර තිබේ නම් ඒවා සඳහා මේ නියෝගවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) කිසිම පුද්ගලයකු විසින් ආහාර විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, විකිණීමට ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම පිණිස තබා ගැනීම විකිණීම පිණිස ප්‍රවාහනය කිරීම කාලය ඉකුත්වීමේ දිනයෙන් පසුව නොකළ යුතු ය.

05. (1) 04 වැනි නියෝගයේ කාර්ය සඳහා :–

(අ) පොදු නාමය සඳහා යොදාගනු ලබන අකුරුවල ප්‍රමාණය, වර්ග නාමය සඳහා යොදාගනු ලබන අකුරුවල ප්‍රමාණයෙන් තුනෙන් එකකට වඩා අඩු නොවිය යුතු අතර, මිලි මීටර් තුනක අවම උසකින් විය යුතු ය. පොදු නාමය වචන එකකින් හෝ වචන එකකට වඩා වැඩි ගණනකින් සමන්විත වන්නේ නම්, ඒ වචනය හෝ වචන (අවශ්‍ය පද, නිපාත හෝ සන්ධි හැර) සමාන මෝස්තරයෙන් සහ ප්‍රමාණයෙන් විය යුතු අතර, එකම ආකාරයෙන් දැක්විය යුතු ය.

(ආ) නියෝගවල නිශ්චිතව සඳහන් පරිදි අතිරේක ලේබල්වල පොදු නාමය සඳහා යොදාගනු ලබන අකුරු ප්‍රමාණයේ උස ඒ ඇසුරුමේ හෝ බහාලුවේ ප්‍රධාන රාමුවේ දැක්වෙන පොදු නාමය සඳහා යොදාගන්නා ලද අකුරුවල උසින් අඩකට වඩා අඩු නොවිය යුතු අතර, එය මිලි මීටර් තුනක අවම උසකට යටත් විය යුතුය.

(ඇ) නිෂ්පාදනයක ශුද්ධ බර ග්‍රෑම් 25 නොඉක්මවන හෝ ශුද්ධ පරිමාව මිලි ලීටර් 30 නොඉක්මවන අවස්ථාවක අකුරුවල අවම උස ප්‍රමාණය මිලි මීටර් 1.5ට නොඅඩු විය යුතුය.

(ඈ) ඇසුරුමේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග සෙන්ටිමීටර් 25 නොඉක්මවන විටක ප්‍රධාන ආහාර බලධරයාට ශුද්ධ බර ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට හැකි ය.

(ඉ) මේ නියෝගවල අනුපිළිවෙලින් 1(ඈ), 2(ඉ) සහ 2(ඊ) ඡේදවල සඳහන් ප්‍රකාශනයේ යොදාගනු ලබන අකුරු ඝන ආකාරයෙන් දැක්විය යුතු අතර, ඒවායේ උස ප්‍රමාණය මෙහි II වැනි උපලේඛනයෙහි, I වැනි තීරුවේ නියම කර ඇති උසට වඩා නොඅඩු උසකින් යුක්ත විය යුතු ය. කෙසේ වෙතත් ලේබලයේ ප්‍රධාන රාමුවේ වර්ග ප්‍රමාණය එකී උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නියම කර ඇති ආකාරයට විය යුතු ය.

(ඊ) (ඉ) ඡේදයේ දැක්වෙන ප්‍රකාශය හැර, ප්‍රකාශයන් පැහැදිලි ඝන අකුරින් මුද්‍රණය කර තිබිය යුතු අතර, උස ප්‍රමාණය මිලි මීටර් 1.5කට අඩු නොවිය යුතු ය. කුඩා මලු සම්බන්ධයෙන් නම්, ප්‍රකාශනයක් නෙරා ඇති පරිදි මුද්‍රණය කරනු ලබන විටකදී ඝන අකුරින් විය යුතු ය. බීම වර්ග අඩංගු බෝතල්වල වැසුමෙහි කුමන හෝ ප්‍රකාශයක් සිදු කිරීම සඳහා යොදාගනු ලබන අකුරුවල ප්‍රමාණය උස මිලි මීටර් 01කට වඩා අඩු නොවිය යුතු ය.

(උ) ඇසුරුමක හෝ බහලුවක ඇතුළත් ආහාර හා සම්බන්ධ කල් ඉකුත්වීමේ දිනය, ඉලක්කම් ස්වරූපයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකිය. දිනය, මාසය හා වර්ෂය යන පිළිවෙලට හෝ වර්ෂය, මාසය, දිනය යන පිළිවෙලට දක්වනු ලැබිය යුතුය. එසේ වුවද වර්ෂය ඉලක්කම් හතරකින් ප්‍රකාශ විය යුතු අතර ඊට මුලින් Expiry යන වචන හෝ Exp යන එහි කෙටි යෙදුම සහ සිංහල අකුරින් "කා. ඉ. දි." යන යෙදුම හෝ දෙමළ භාෂාවෙන් "கா.தேதி"යන යෙදුමද ඇතුළත් විය යුතු ය

එසේ වුවද වර්ෂය ඉලක්කම් 2කින් පමණක් දක්වන්නේ නම් ආකෘතිය, දිනය, මාසය සහ වර්ෂය යන අනුපිළිවෙල අනුව යොදාගත යුතු ය.

එසේ ම තවදුරටත්, කල් ඉකුත්වීමේ දිනය ලෙස මාසය සහ වර්ෂය පමණක් දැක්වෙන අවස්ථාවල දී ඒ නිෂ්පාදිතයේ කල් ඉකුත්වන දිනය එම මාසයේ අවසන් දිනය ලෙස සැළකිය යුතු ය.

(ඌ) කිසියම් ඇසුරුමක හෝ බහලුවක අඩංගු ආහාර සම්බන්ධයෙන් එහි නිෂ්පාදිත දිනයේ වර්ෂය ඉලක්කම් 4කින් දක්වන්නේ නම් එය දිනය මාසය වර්ෂය වශයෙන් හෝ වර්ෂය මාසය දින වශයෙන් "නිෂ්පාදිත දිනය" "නිෂ්පාදනය කරන ලද දිනය" හෝ ඉංග්‍රීසි බසින් MFD සිංහල බසින් "නි. දි." සහ දෙමළ බසින් "உ.தேதி" යන කෙටි යෙදුම් ඉදිරියෙන් සංඛ්‍යාත්මක වශයෙන් සටහන් කිරීමට පිළිවන.

එහෙත් වර්ෂය ඉලක්කම් 02කින් පමණක් දක්වන්නේ නම් එහි ආකෘතිය දිනය, මාසය, වර්ෂය යන අනුපිළිවෙල අනුව සිදුවිය යුතු ය.

(එ) (උ) ඡේදයේ විධිවිධාන වල කුමක් සඳහන් වුවද කල් ඉකුත්වීමේ දිනය ඉලක්කම් දෙකකින් යුත් ආකෘතිය අනුව සඳහන් කිරීමේදී දිනය, මාසය, වර්ෂය සඳහා දිදි/මාමා/වව වශයෙන් ද වර්ෂය, මාසය, දිනය සඳහා වව/මාමා/දිදි සංකේත යොදා සටහන් කර භාෂා 3න් කවර හෝ භාෂා දෙකකින් කල් ඉකුත්වීම හෝ ඒ සඳහා වන "ක ඉකුත්" යන කෙටි යෙදුම ඉදිරියෙන් අදාල සංකේතවලට ඉහළින් එය යෙදෙන ආකාරය අනුව සටහන් කළ යුතු ය.

(ඒ) ඉහත "ඌ" ඡේදයේ විධිවිධාන වල කුමක් සඳහන් වුවද නිෂ්පාදිත දිනය ඉලක්කම් දෙකකින් යුත් ආකෘතියක් අනුව සඳහන් කිරීමේදී යෙදෙන ආකාරය අනුව දිනය, මාසය සහ වර්ෂය "දිදි/මාමා/වව" වශයෙන් ද, වර්ෂය, මාසය හා දිනය සඳහා "වව/මාමා/දිදි" වශයෙන් ද නිෂ්පාදිත දිනය නිෂ්පාදනය කරන ලද දිනය හෝ ඉංග්‍රීසි බසින් "MFD" හෝ සිංහල බසින් "නි දි" හෝ දෙමළ බසින් "உ.தேதி" යන කෙටි යෙදුම ඉදිරියෙන් අදාළ වදන්වලට ඉහළින් මුද්‍රණය කළ යුතු ය.

(2) 1(ඉ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද කිසියම් ඇසුරුමක හෝ බහාලුවක ඇතුලත් ආහාර සම්බන්ධයෙන් නිෂ්පාදිත දිනය සහ කල් ඉකුත්වීමේ දිනය සිදුරු ආකාරයෙන් (ටයිප් කර) දැක්විය යුතු ය.

එයට "දිනට පෙර පාවිච්චි කරන්න" හෝ "දිනට පෙර ඉතා හොඳයි" යන යෙදුම "කල් ඉකුත්වීමේ දිනයන්" යන යෙදුම වෙනුවට යෙදීමට පුළුවන.

මෙම නියෝගවල කාර්යය සඳහා "දිනට පෙර ඉතා හොඳයි" හා දිනට පෙර පාවිච්චි "කරන්න" යන යෙදුම් "කල් ඉකුත්වීමේ දිනය" යන අර්ථයම ඇතුළත් වේ.

06. (1) සලාද තෙල්, එළවළු තෙල්, මිශ්‍රිත එළවළු තෙල් හෝ වෙනත් නමක් හෝ විස්තරයක් සහිත කෑමට සුදුසු තෙල් (කුමන හෝ පිරිපහදු කළ තෙල් ඇතුළත්ව) සම්බන්ධයෙන් ඒවායේ පොදු නාමය සහ ඒවා ලබාගන්නා ලද මූලාශ්‍රය පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන ලෙස සඳහන් කළ යුතු ය.

(2) මේ නියෝගවල (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද :-

(අ) යම් මිශ්‍රිත එළවළු තෙල් එම මිශ්‍රණයේ අන්තර්ගත සංඝටකයන් ලේබලයේ දක්වා ඇත්නම් එම මිශ්‍රණයෙන් සියයට හැත්තෑපහකට (75%) වැඩි ප්‍රමාණයක් අඩංගු වන තෙලහි නම යොදා එය මිශ්‍රිත එළවළු තෙල් වශයෙන් ලේබල් කිරීම සිදු කළ හැකි ය.

(ආ) එළවළු තෙල් මිශ්‍රණයක සංඝටකයන් එම මිශ්‍රණයෙන් සියයට හැත්තෑපහක (75%)ක ප්‍රමාණය නොඉක්මවයි නම්, එම මිශ්‍රණයෙහි අන්තර්ගතයේ ප්‍රමාණයන් ලේබලයේ දක්වමින් එය මිශ්‍රිත එළවළු තෙල් යනුවෙන් ලේබල් කිරීම සිදු කළ යුතු ය.

(3) කුමන හෝ සීනි රසකැවිලි හෝ චොකලට් නිෂ්පාදනයක විස්තරයක –

(අ) එම රසකැවිලි හෝ චොකලට් නිපදවීම සඳහා යොදාගනු ලබන මේද ප්‍රමාණයෙන් බරින් සියයට හතරකට (4%) නොඅඩු ප්‍රමාණයක් බටර් මේදය අන්තර්ගත වන්නේ නම් මිස :

(ආ) කුමන හෝ පිටි රසකැවිලි නිෂ්පාදනයක විස්තරයක එවැනි පිටි රසකැවිලි නිපදවීමේ දී යොදාගනු ලබන මේදය මුළුමනින්ම බටර් මේදයෙන් සමන්විත වන්නේ නම් මිස,

ඒ රසකැවිලි හෝ චොකලට් නිෂ්පාදනයේ ලේබලයේ හෝ ඒ පිටි රසකැවිලි නිෂ්පාදනයේ ලේබලයේ "බටර්" යන නම ඒ සඳහා යොදා නොගතයුතු අතර, සමාන පදයක් හෝ බටර් අන්තර්ගත වන බව හැඟවෙන කුමන හෝ වචනයක් සඳහන් නොවිය යුතු ය.

07. (1) ඇසුරුම් කරනු ලැබූ ආහාරයක කුමන හෝ ලේබලයක වෙනත් නිෂ්පාදනයක් සමග ව්‍යාකූලවන ආකාරයට එම නිෂ්පාදනය සෘජුව හෝ වක්‍රව සඳහන් කිරීමක් හා ඇඟවීමක් සිදුවන ආකාරයට හෝ එවැනි නිෂ්පාදනයක් සමග එම ආහාරය සම්බන්ධ වන බවට පාරිභෝගිකයාට අදහසක් ඇතිවන ආකාරයට වචනයෙන්, චිත්‍රයෙන් හෝ වෙනත් මාර්ගයක් මගින් විස්තර කිරීමක් හෝ යෝජනා කිරීමක් නොකළ යුතු ය.

(2) සෘජුව හෝ යළි සකස් කොට පානය කිරීම සඳහා පළතුරුවලින් සකස් කොට ඇති පානවර්ග සම්බන්ධයෙන් මෙහි III වැනි උපලේඛනයෙහි නියම කර ඇති පළතුරු යුෂ ප්‍රමාණය අන්තර්ගත වේ නම්, මිස එය නියම පළතුරු වලින් සකස් කළ පානයන් ලෙසට කවර හෝ ලේබලයක හෝ දැන්වීමක විස්තර නොකළ යුතු වූ අතර, එය අවස්ථාවෝචිත පරිදි "කෘත්‍රිම සිරප්", කෘතිම කෝඩියල් හෝ කෘතිම පාන වශයෙන් විස්තර කළ යුතු ය.

(3) ශාක නිෂ්පාදන පැසවීම මගින් නිෂ්පාදනය කරනු ලබන ඕනෑම විනාකිරි අඩංගු බෝතලයක් හෝ බඳුනක් හැර අනෙක් නිෂ්පාදන "කෘත්‍රිම විනාකිරි" වශයෙන් ලේබල් කළ යුතු ය.

(4) මේ නියෝගවල (2) සහ (3) වැනි ඡේදවල කෘත්‍රිම ලෙස සඳහන් කරනු ලැබ ඇති යම් ආහාර වර්ගයකට හෝ විනාකිරිවලට අදාළ වන යම් ලේබලයක හෝ වෙළඳ දැන්වීමක :–

(අ) නිෂ්පාදනයේ නමට ඉතාම සමීපව, "කෘතිම", යන වචන පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන ලෙස සඳහන් කළ යුතු අතර, එම වචනය සඳහා යොදාගත යුතු අකුරුවල වර්ගය සහ ප්‍රමාණය නිෂ්පාදනයේ පොදු නම සඳහා යොදාගනු ලබන වර්ගයේ සහ ප්‍රමාණයේම ඒවා විය යුතු ය.

(ආ) එවැනි නිෂ්පාදනයක විස්තරයක "පළතුරු" යන වචනය සඳහන් නොකළ යුතු අතර, කුමන හෝ පළතුරක චිත්‍රයක් එහි දැක්වීම නොකළ යුතු ය.

(ඇ) කෘත්‍රිම විනාකිරි ලේබලයක, විනාකිරිවලට සම්බන්ධ කුමන හෝ ශාකයක් හෝ ශාක නිෂ්පාදනයක් ගැන චිත්‍රයක් මගින් නිරූපනය නොකළ යුතු ය.

(5) (2) සහ (4) වැනි ඡේදවල සඳහන් විධිවිධාන සාබනීකරණය කරන ලද සිසිල් බීම වර්ග සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

08. රසකැවිලි, චොක්ලට්ස්, බිස්කෝතු සහ පළතුරු නොවන දෑ යොදා සෑදූ නිෂ්පාදනයෙන් හා බීම මිශ්‍රණ, අතුරුපස වැනි පළතුරු යොදා නොගෙන සාදන ලද නිෂ්පාදනයන් සම්බන්ධයෙන් පළතුරක නමක් හෝ පළතුරු වල නම් හෝ පළතුරක හෝ පළතුරුවල සටහන් අඩංගු චිත්‍රයක් ලේබලයේ ඇතුළත් කළ හැකි ය.

එසේ වුව ද පළතුරුවලින් සාදනු නොලැබූ මිශ්‍ර බීම මිශ්‍රණ වර්ග සහ අතුරුපස සම්බන්ධයෙන් වනවිට, පලතුරු වර්ගයේ නම හෝ නම් "කෘත්‍රිම" යනුවෙන් අදහස් කරමින් "X" වලින් රස ගන්වන ලද බීම/මිශ්‍රණය/අතුරුපස" යන පොදු නාමය ලේබලයේ ප්‍රධාන කොටසෙහි සඳහන් කර තිබිය යුතු ය.

09. (1) ආහාර පනතේ ඇති නියෝගවල කිසියම් ආහාරයක් සඳහා ප්‍රමිතියක් නිශ්චිතව නියම කර ඇති විටක එවැනි ප්‍රමිතියක නම් කර ඇති සංඝටක හැර වෙන කිසිවක් එවැනි ආහාරයක නොයෙදිය යුතු ය. වෙනත් යම් සංඝටක එකතු කිරීමක් හෝ සම්මිශ්‍රණ කිරීමක් එම සංඝටක සම්බන්ධව ලේබලයක්, දැන්වීමක් හෝ ප්‍රකාශයක් ඇතිව හෝ නැතිව සිදු කිරීම තහනම් විය යුතු ය.

(2) ආහාර පනත යටතේ ඇති නියෝගවල කිසියම් ආහාරයක් සඳහා ප්‍රමිතියක් නිශ්චිත ලෙස සඳහන් කර නොමැති විටක වෙනත් එකතු කිරීමක් සම්මිශ්‍රණ කිරීමක් හෝ යම් ඌනතාවයක් වේ නම් එවැනි ආහාරයක් සම්බන්ධයෙන් වන ලේබලයේ හෝ දැන්වීමේ එවැනි එකතු කිරීමක් හෝ සම්මිශ්‍රණයක් හෝ අඩුපාඩුවක් තිබෙන බවට ප්‍රකාශයක් කළ යුතු අතර අදාළ වන පරිදි එසේ එකතු කරන ලද සම්මිශ්‍රණයක් හෝ ඌණතාවය සිදුව ඇති සංඝටකයේ නාම සහ ප්‍රතිශතය පැහැදිලිව ප්‍රකාශනයේ සඳහන් කළ යුතු ය.

10. (1) අයනීකරණ විකිරණ ප්‍රතිකාරයට භාජනය කරන ලද ආහාරයක ලේබලයේ ඒ පිළිබඳව දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් එම ආහාරයේ පොදු නාමයට ඉතා සමීපව දැක්විය යුතු ය. පහත දැක්වෙන ජාත්‍යන්තර සංකේතය ද එම පොදු නාමටය ඉතා සමීපව දැක්විය යුතු ය :–



(2) විකිරණයට භාජන කරන ලද නිෂ්පාදනයක් වෙනත් ආහාරයක සංඝටකයක් ලෙස භාවිතා කරනු ලබන විට, මේ නියෝගවල (1) වැනි ඡේදයේ සඳහන් ආකාරයටම එම නිෂ්පාදනය පිළිබඳව සංඝටක ලැයිස්තුවේ සඳහන් කළ යුතු ය.

(3) එක් සංඝටකයක් සහිත නිෂ්පාදනයක් විකිරණයට භාජනය කරන ලද අමුද්‍රව්‍යයකින් පිළියෙල කරනු ලැබූ විට එසේ භාජනය කල ක්‍රියාවලිය පිළිබඳ ප්‍රකාශයක් නිෂ්පාදනයේ ලේබලයේ අන්තර්ගත විය යුතු ය.

11. ප්‍රධාන ආහාර බලධරයාගේ අනුමැතියක් නොමැතිව කිසියම් ආහාරයක් සම්බන්ධයෙන් වන ලේබලයක හෝ දැන්වීමක එය වෛද්‍ය වෘත්තිකයෙකු හෝ සංගමයක් විසින් හෝ යම් වෘත්තිකයෙකු විසින් නිර්දේශ කර ඇති බව දැක්වෙන වචන නොයෙදිය යුතු අතර, කිසියම් වෛද්‍ය වෘත්තිකයෙකු හෝ සංගමයක් හෝ යම් වෘත්තිකයෙකු විසින් එවැනි ආහාරයක් නිර්දේශ කරන ලද බවට හෝ නියම කරන ලද බවට හෝ අනුමත කර ඇති බැව් අඟවනු ලබන වෙනත් වචන හෝ උපක්‍රම හෝ පිංතූරමය හෝ වෙනත් ආකාරයක කිසිවක් නෙයෙදිය යුතු ය.

12. කුමන හෝ ආහාරයක විශේෂ ගති ලක්ෂණ ඇති බවට ප්‍රධාන ආහාර බලධරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, ඒ ආහාරයට සම්බන්ධ ලේබලයක හෝ දැන්වීමක එම ගති ලක්ෂණ ඇති බවට ප්‍රකාශයක් හෝ හිමිකම් පෑමක් ඇතුළත් නොවිය යුතු ය.

13. (1) යම් ආහාරයකට අදාළ ලේබලයක, ඒ ආහාරය මිලදී ගන්නා හෝ පාරිභෝගිකයා රවටන හෝ නොමඟ යවන ආකාරයට ඒ ආහාරය පිළිබඳ ව්‍යාජ හිමිකම් පෑමක් හෝ නොමඟ යවන සුළු විස්තරයක් අන්තර්ගත නොවිය යුතු ය.

(2) කිසිදු ආහාරයක් සාවද්‍ය හෝ නොමඟ යවන සුළු හෝ වංචනික ලෙස හෝ එහි ගති ලක්ෂණ සම්බන්ධයෙන් කවර ආකාරයකින් හෝ සාවද්‍ය හැඟීමක් ඇති කරන ආකාරයකින් විස්තර කිරීම හෝ ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

(3) මේ නියෝගයේ කාර්ය සඳහා :-

"හිමිකම් පෑමක්" යන්නෙන් කිසියම් ආහාරයක සම්භවය, පෝෂණ ගුණාංග, ස්වභාවය, පිරිසැකසුම, සංයුතිය හෝ වෙනත් කුමන හෝ තත්ත්වයක් සම්බන්ධයෙන් විශේෂ ගුණාංග ඇති බවට ප්‍රකාශ කරනු ලබන, අදහස් කරනු ලබන හෝ අඟවනු ලබන කුමන හෝ නියෝජනයකි.

එසේ වුව ද මෙම නියෝගවල V වන උපලේඛනයේ "අ" වගුවේ නිශ්චිත වශයෙන් දක්වා ඇති කොන්දේසිවලට අනුකූලවන්නේ නම් පමණක් ආහාර සඳහා පෝෂණ හිමිකම් යොදාගැනීමට හැකිවනු ඇත.

(4) කිසියම් ආහාර ද්‍රව්‍යයක් ආහාර පනත යටතේ ඇති නියෝගවල නියම කර ඇති ගති ලක්ෂණ, වටිනාකම, සංයුතිය සහ යෝග්‍යතාවයකින් යුක්ත නොවේ නම් සහ කවර හෝ වර්ගයක ආකළන ද්‍රව්‍යයක් අඩංගු නොවේ නම් මිස, එම ආහාර ද්‍රව්‍ය පිළිබඳ විස්තරය ඇතුළත් වන ආහාර ලේබලයේ "පිරිසිදු" යන වචනය හෝ එම ආහාරය "පිරිසිදු" බැව් අඟවනු ලබන වෙනත් වචන හෝ ඇතුළත් නොවිය යුතු ය.

(5)(අ) කිසියම් ආහාරයක් හෝ ආහාර නිෂ්පාදනයක් අමිශ්‍ර, බාල නොකරන ලද හෝ පිරිසැකසුම් නොකරන ලද සහ ආකලන රහිත නිෂ්පාදනයක් නොවේ නම් (එය පැස්චරීකරණය කිරීම, ශීත කිරීම හෝ අධිශීත කිරීමට භාජනය කළ හැකි අතර)

(ආ) එම ආහාරය හෝ ආහාර නිෂ්පාදනය කෘත්‍රිම ද්‍රව්‍යයන්ගෙන් මුළුමනින්ම තොරව ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයන්ගෙන්, නිෂ්පාදනය කරන ලද්දක් වේ නම් මිස

ස්වභාවික යන වචනය එම ආහාරය විස්තර කරනු ලබන ලේබලයේ නොයෙදිය යුතු ය.

(6) කිසියම් ආහාර ද්‍රව්‍යයක ලේබලයක එම ආහාරය විස්තර කිරීමේදී එය ආදේශක ආහාරයක් වශයෙන් එවැනි විස්තරයක යොදා ගැනීමට මෙහි ඇති කවර හෝ නියෝගයක් යටතේ අවසර දී ඇති නම් මිස, එවැනි ආහාරයක් සඳහා "ආදේශක" හෝ ආදේශක බැව් හඟවන වෙනත් වචනයක් හෝ නොයෙදිය යුතු ය.

(7) (i) (අ) කිසියම් ආහාර ලේබලයක හෝ දැන්වීමක එම ආහාරයේ අන්තර්ගත පෝෂණ සංයුතිය සහ පරිභෝජනය සඳහා ආහාරයෙන් නිර්දේශිත ප්‍රමාණය දැක්වෙන ප්‍රකාශයක් ඇතුළත් නොවේ නම්, එම ආහාරයේ විශේෂ පෝෂණ වටිනාකමක් අන්තර්ගත වන බවට ;

(ආ) එවැනි ආහාරයකින් දිනකට සාධාරණ වශයෙන් පරිභෝජනය කරනු ලැබේ යයි අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයක මෙම IV වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට එවැනි පෝෂන පදාර්ථයකින් හෝ පදාර්ථයන්ගෙන් දිනපතා ආහාර වශයෙන් ගැනීමට නිර්දේශිත ප්‍රමාණයෙන් තුනෙන් එකක් අඩංගු නොවන්නේ නම් එවැනි ආහාරයක් පෝෂණ පදාර්ථ එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා ප්‍රමාණවත් මූලාශ්‍රයක් බවට : හෝ

(ඇ) එවැනි ආහාරයකින් දිනකට සාධාරණ වශයෙන් පරිභෝජනය කරනු ලැබේ යයි අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයක දිනපතා ගැනීමට නිර්දේශිත කාබෝහයිඩ්රේට්, ප්‍රෝටීන්, මේද, විටමින් හෝ ඛණිජ ලවණ ප්‍රමාණයන්ගෙන් අවම වශයෙන් සියයට පහක ප්‍රමාණයක් අඩංගු බවට එම ආහාරයේ ලේබලයේ හෝ දැන්වීමක ප්‍රකාශයක් ඇතුළත් නොවන්නේ නම් එම ආහාරය කාබෝහයිඩ්රේට්, ප්‍රෝටීන්, මේද, විටමින් හෝ ඛණිජ ලවණ අඩංගු ආහාරයක් බවට හෝ,

එවැනි ආහාර ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් ලේබලයක හෝ දැන්වීමක ප්‍රකාශයක්, හිමිකම් කියාපෑමක් ඇතුළත් නොකළ යුතුය. මෙම නියෝගවල කාර්යය සඳහා නිර්දේශිත දෛනික ප්‍රත්‍ය ආහාර ප්‍රමාණය මෙහි IV වැනි උපලේඛනය අනුව විය යුතු ය.

(ii) (අ) දිනකට පරිභෝජනය කිරීම සඳහා සාධාරණ වශයෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයෙන් ප්‍රෝටීන් අවම වශයෙන් ග්‍රෑම් දොළහක් අඩංගු නොවේ නම් ;

(ආ) ආහාරයේ ශක්ති අගයෙන් අවම වශයෙන් සියයට විස්සක් (20%) ප්‍රෝටීන් වලින් නොලැබෙන්නේ නම් ;

(ඇ) ආහාරයේ ප්‍රෝටීන් අන්තර්ගතය, ග්‍රෑම් සියයක හෝ මිලි ලීටර් සියයක අඩංගු ග්‍රෑම් සංඛ්‍යාව ලෙස සඳහන් නොවන්නේ නම් ;

ප්‍රෝටීන් මූලාශ්‍රයක් ලෙසට ඒ ලේබලයේ හෝ දැන්වීමක ප්‍රකාශයක් නොකළ යුතු ය.

(iii) කිසියම් ආහාරයක ස්වභාවික වශයෙන් අඩංගුවන දේවලට අමතරව, එකතු කළ විටමින්, ඛණිජ ලවණ හෝ ඇමිනෝ අම්ල අන්තර්ගත වේ නම් මිස, එවැනි ආහාරයක් සම්බන්ධ ලේබලයක හෝ දැන්වීමක, එම ආහාරය සරුකළ ආහාරයක් ලෙස සඳහන් නොකළ යුතු ය. තවද එම ලේබලයේ එසේ අන්තර්ගත එම ද්‍රව්‍යවල ප්‍රතිශතයන් ප්‍රකාශ කළ යුතු ය.

(iv) ආහාර සවිමත් කිරීමේ සීමාවක් පිළිබඳ ප්‍රධාන ආහාර බලධරයාගේ අනුමැතියට යටත්ව කිසියම් ආහාරයකට එකතු කරන ලද කුමන හෝ පෝෂණ පදාර්ථයක් එම ආහාරයේ ස්වභාවිකවම අන්තර්ගත වූවක් නොවේ නම්, එය සවිමත් කළ ආහාරයක් ලෙස එහි ලේබලයක හෝ දැන්වීමක හෝ ප්‍රකාශ නොකළ යුතු ය.

(v) යම් ලේබලයක හෝ දැන්වීමක සමාන ගුණාංග ඇති සමාන ආහාරයක් සම්බන්ධයෙන් හිමිකම් පෑමක් හෝ ප්‍රකාශයක් කරනු ලැබ ඇති අවස්ථාවක මුල් ප්‍රකාශයෙහි සඳහන් භාෂාවන්ගෙන් හා අකුරු වර්ගයෙන්ම මුල් ප්‍රකාශයට ආසන්නවම එම ලේබලයේ හෝ දැන්වීමේ සමාන ආහාරයන්ගේ සමාන ගුණාංග තිබෙන බවට ප්‍රකාශයක් කළ යුතු ය.

උදා. : එළවළු තෙල් අඩංගු බඳුනක ලේබලයක තෙල්වල කොලොස්ටරෝල් නොමැති බව සඳහන් වන්නේ නම්, එම භාෂාවන්ගෙන් හා අකුරු වර්ගයෙන්ම එකී මුල් ප්‍රකාශයට ආසන්නව, එළවළු තෙල්වල කොලොස්ටරෝල් අඩංගු නොවන බවට ලේබලය මත තවත් ප්‍රකාශයක් කළ යුතු ය.

(vi) කිසියම් පලතුරු නිෂ්පාදනයක හෝ එළවළු නිෂ්පාදනයක හෝ සීනි පදනම් කොටගත් නිෂ්පාදනයක එම නිෂ්පාදනයේ ග්‍රෑම් සියයක ඇස්කෝබික් අම්ලය මිලිග්‍රෑම් හතළිහකට නොඅඩු ප්‍රමාණයක් අඩංගු නොවේනම්, ආහාරයක් "විටමින් C වලින් සවිමත් කළ හෝ සරු කළ" ලෙසට ප්‍රකාශයක් ඇතුළත් නොකළ යුතු ය.

(8) (i) යම් ආහාරයකට අදාළව, විශේෂ ආහාර ක්‍රමයක් භාවිතය පිළිබඳව අදහස් කරමින් ලේබලයේ හෝ දැන්වීමේ ප්‍රකාශයක් හෝ හිමිකම් පෑමක් කර ඇති අවස්ථාවක, එම ආහාරය නිර්දේශ කරනු ලබන්නේ යම් ක්‍රමයකට අනුව ද යන්න සඳහන් කරන ප්‍රකාශයක් එම ලේබලයේ තිබිය යුතු ය.

(ii) කිසියම් ආහාරයක් සම්බන්ධයෙන් අඩු සෝඩියම් ප්‍රමාණයක් අන්තර්ගත වන බවට හඟවන ප්‍රකාශයක් හෝ හිමිකම් කියාපෑමක් එම ලේබලයේ හෝ දැන්වීමක සඳහන්ව තිබේ නම්, එම ආහාරයේ ග්‍රෑම් සියයකට සෝඩියම් මිලි ග්‍රෑම් කොපමණ ප්‍රමාණයක් බැගින් අඩංගු වන්නේ ද යන්න පිළිබඳව එහි සඳහන් කළ යුතු ය.

(iii) (අ)දිනකට පරිභෝජනය කරනු ලැබේ යයි සාධාරණ වශයෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයකින් කි. කැලරි තුන්සියයක් සපයනු ලබන්නේ නම් ; සහ

(ආ)එවැනි ආහාරයක ග්‍රෑම් සියයක ප්‍රමාණයකින් ලැබෙන කි. කැලරි ශක්ති ප්‍රමාණය පිළිබඳ සත්‍ය ප්‍රකාශයක් එම ආහාරයේ ලේබලයේ සඳහන් වන්නේ නම් මිස,

එවැනි ආහාරයක ලේබලයේ හෝ දැන්වීමක එම ආහාරය ශක්තිය නිපදවන හෝ තාපජනක (කැලරිපික්) ආහාරයක් ලෙසට සෘජුව හෝ වක්‍රව සඳහන් කිරීම නොකළ යුතු ය.

(9) කිසියම් ආහාරයක් සම්බන්ධ ලේබලයක හෝ දැන්වීමක -

(i) ආහාරමය මේදයන් හදවත් රෝග වලින් පෙලෙන තැනැත්තන් සඳහා ආරක්ෂාකාරී හෝ හිතකර බවට හිමිකම්පාන ප්‍රකාශයක් නොකළ යුතු ය.

(ii) කිසිදු ආහාරයක් ගිලනුන් සඳහා හිතකර බවට හෝ, කවර හෝ රෝගයක් සුවකරන හෝ රෝගයකට සහනය ලබාදෙන හෝ රෝගය වැලැක්වීමට හැකිවන්නා වූ ටොනික් වර්ගයක් ශක්තිජනක හෝ ඖෂධීය ගුණයක් හෝ ගුණාංග ඇතුළත්වන බවට හෝ, සෘජුව හෝ වක්‍රව ප්‍රකාශ කිරීම නොකළ යුතු ය.

(iii) කිසිදු ආහාරයක්, කුමන හෝ රෝගයක් සුව කරන බවට සෘජුව හෝ වක්‍රව ප්‍රකාශයක් නොකළ යුතු ය.

(iv) කිසිදු ආහාරයක් උපක්‍රමයෙන් ශරීරය කෘශ කිරීමට, ශරීරයේ බර පාලනය කිරීමට හෝ ශරීරයේ බර අඩු කිරීමට උදව් කරන බවට හිමිකම් කියාපෑමක් නොකළ යුතු ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල –

"පනත" යන්නෙන් 1980 අංක 26 දරන ආහාර පනත අදහස් වේ.

"ප්‍රධාන ආහාර බලධරයා" යන්නට පනේත ඇති අර්ථයම තිබිය යුතු ය.

"ආහාරයක පොදු නාමය" යනු ආහාරය පොදුවේ හඳුන්වනු ලබන නාමයයි.

"අතුරුපස පිළියෙල කිරීම" යන්නට ජෙලි කැට සහ පුඩිං මිශ්‍රණ ද ඇතුළත් වේ.

"පිටි රසකැවිලි" යනු ෂෝට් බ්‍රෙඩ්, ක්‍රම්පට්ස් ස්පන්ජ්, මෆින්ස්, මැකරොනිස්, රැටාෆියාස්, පේස්ට්‍රි සහ පේස්ට්‍රි කේක්ස් ඇතුළුව කාබෝහයිඩ්‍රේට්ස්, චොකලට් හෝ කොකෝවා රසකාරක යොදා හෝ නොයොදා රස කරන ලද හෝ රස තවරන ලද මෙරැග්ස්, පෙටි ෆලූටර් සහ නොපිසින ලද පේස්ට්‍රි සහ පේස්ට්‍රි කේක්ස් ද ඇතුළත්ව අඹරන ලද ධාන්‍ය ප්‍රධාන මිශ්‍රණය වශයෙන් පවත්නා තවදුරටත් සකස් කිරීමක් හෝ පිරිසැකසුම් කිරීමක් (නැවත රත්කිරීමක් හැර) රහිතව පරිභෝජනයට යෝග්‍ය වූ පරිපූර්ණ ඝන හෝ අර්ධ ඝන සහිත නිෂ්පාදනයක් අදහස් කෙරෙන අතර, මෙයට පාන්, විස්කෝතු, පීසාස් හෝ වෙනත් කුමන හෝ පුරවන ලද ද්‍රව්‍යයක් හෝ මස්, මාළු, චීස්, කෑමට සුදුසු අතුනුබහන්, කබලු මත්ස්‍ය, එළවළු ප්‍රෝටීන් ද්‍රව්‍ය හෝ මයික්‍රෝබියල් ප්‍රෝටීන් ද්‍රව්‍ය ඇතුළත් නොවේ.

ප්‍රධාන රාමුව.- යනු සිල්ලරට විකිණීම සඳහා පාරිභෝගික කොන්දේසි යටතේ ප්‍රදර්ශනය කිරීම, ඉදිරිපත් කිරීම, දැක්වීම හෝ පරීක්ෂා කිරීමට උචිතම ලේබලයේ කොටසකි. කෙසේ වුව ද ප්‍රධාන රාමුව වශයෙන් සලකනු ලබන ප්‍රදේශය භාජනයේ හෝ ඇසුරුමේ පතුල හැරෙන්නට එහි මුළු මතුපිට වර්ගඵලයෙන් සියයකට විස්සකට නොඅඩු විය යුතු ය.

සීනි රසකැවිලි යනු; කැමට ගතහැකි මේද, කිරි නිෂ්පාදන, ජෙලටින්, කැමට ගතහැකි මැලියම් (ගම්), ඇට වර්ග හෝ කල් තබාගත හැකි සේ සකස් කළ පලතුරු එක් කිරීම සහිතව හෝ රහිතව රසකළ ලැකරයිස් සහ චුවින්ගම් ද ඇතුළත්ව පිෂ්ඨධාතු (කාබෝහයිඩ්‍රේට්) ප්‍රධාන රසකාරක වශයෙන් සැලකෙන තවදුරටත් සකස් කිරීමකින් හෝ පිරි සැකසුම් කිරීමකින් තොරව පරිභෝජනයට සුදුසු ඝන හෝ අර්ධ වශයෙන් ඝන සම්පූර්ණ ආහාරයකි. එහෙත් මෙයට චොකලට්, රසකැවිලි, අයිස්ක්‍රීම් වර්ග, අයිස් ලොලීස්, ටේබල් ජෙලීස්, ටේබල් ජෙලි සැකසුම්, ස්ලැබ්, මාසිපන්, මොරැන්ගස් හෝ ඖෂධ නිෂ්පාදන හෝ සීනි ඇතුළත් නොවේ.

"තොග ඇසුරුම" යනුවෙන් මිල දී ගනු ලබන්නා ඉදිරිපිට දී ගෙන ගණන් කොට කිරා හෝ මැන බලා විකුණනු ලබන කිසියම් ආහාර ද්‍රව්‍යයක් අඩංගු ඇසුරුමක් හෝ බහාලුවක් අදහස් කරනු ලබන අතර කලින් ඇසුරුම් කල සිල්ලර ඇසුරුම් අඩංගු බහාලුවක් එයට ඇතුළත් නොවේ.

15\. 1993 ඔක්තෝබර් 14 දින අංක 788/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද 1980 අංක 26 දරන ආහාර පනත යටතේ පනවන ලද 1993 ආහාර (ලේබල් කිරීමේ සහ විවිධ) නියෝග (පළමුවන කොටස) සහ 2004 ජනවාරි 12 දින අංක 1323/2 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද ආහාර (ලේබල් කිරීම සහ ප්‍රචාරය කිරීම) 2003 නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

## උපලේඛනය - I

නියෝග 4(1)(අ)

(අ) විස්කෝතු :
වීස් බිට්ස්, ක්‍රීම් ක්‍රැකර්ස්, බැන් ක්‍රැකර්, කුරක්කන් ක්‍රැකර්, ක්‍රිස්කෝ, ලෙමන් පෆ්, මාරි, ජින්ජර් නට්ස්, නයිස්, කුකීස්, වේෆර්ස්.

(ආ) මස් නිෂ්පාදන :
බ්‍රැට්වුර්ස්ට්, පසිකා මොර්ටඩෙලා, පෝකීස්, සලාමි, ලින්ගුස්, විපලාටස් බුළුවුර්ස්ට්, වයිට්වර්ස්ට් චිකන් රෝල්, ෆැන්ක්ෆර්ටර්ස් ප්‍රැන්ක්පර්ටස්, ලන්චන් මීට, පැටේ, මීට් ලෝෆ්, මීට් බෝල්ස්, චිකන් රෝල්.

(ඇ) විශේෂ බලයා :
ඇඹුල් තියල්

(ඈ) කාබනිකරණය කළ පැනිබීම :
සියලුම කාබනිකරණය කළ පැණි බීම වර්ග පොදු නාමය භාවිතා කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

## උපලේඛනය - II

නියෝගය (5)(ඉ)

| *I වැනි තීරුව*<br>*අවම උස* | *II වැනි තීරුව*<br>*ලේබලයේ ප්‍රධාන රාමුවේ වර්ග ප්‍රමාණය* |
|---|---|
| මි. මී. 1 | සිසිල් බීම සහ කිරි දියර අන්තර්ගත බෝතල් මුඩිවල |
| මි. මී. 1.5 | වර්ග සෙන්ටි මීටර් 120 ප්‍රමාණය නොඉක්මවා |
| මි. මී. 3 | වර්ග සෙන්ටි මීටර් 120 ඉක්මවමින් සහ වර්ග සෙන්ටිමීටර් 240 නොඉක්මවමින් |
| මි. මී. 6 | වර්ග සෙන්ටි මීටර් 240 ඉක්මවමින් සහ වර්ග සෙන්ටි මීටර් 600 නොඉක්මවමින් |
| මි. මී. 9 | වර්ග සෙන්ටි මීටර් 600 ඉක්මවමින් |

## උපලේඛනය - III

නියෝගය 7(2)

| වර්ගය | පළතුරු යුෂ අන්තර්ගතය |
|---|---|
| මිශ්‍ර කිරීමකින් තොරව පරිභෝජනයට සූදානම් කළ පළතුරු බීම හෝ බීම වර්ගය | පළතුරු යුෂ සියයට පහක නොඅඩු ප්‍රමාණයක් |
| පළතුරුවල යුෂ | පළතුරු යුෂ සියයට 15කට නොඅඩු ප්‍රමාණයක් |
| පළතුරු ක්‍රෂ්, කෝඩියල්, ස්කොෂ් හෝ සිරප් | පළතුරු යුෂ සියයට විසිපහකට 25% නොඅඩු ප්‍රමාණයක් |
| පළතුරු සාන්ද්‍රන (කන්සන්ට්‍රේට්ස්) | පළතුරු යුෂ සියයට හතලිස් පහකට 45% නොඅඩු ප්‍රමාණයක්. |

IV වැනි උපලේඛනය

(13 (7) නියෝගය)

| කාණ්ඩය | විස්තර* | ශරීරයේ බර** කි.ග්‍රෑ. | ශක්ති කි..කැ. | අවශ්‍යතා කි.ජූල් | ප්‍රෝටීන් ග්‍රෑම්/දිනක | කැල්සියම් මිලි ග්‍රෑම් දිනක | යකඩ මි.ග්‍රෑ. දිනක | විටමින් ඒ මයික්‍රො ග්‍රෑ. දිනක | තයමින් මි.ග්‍රෑ. දිනක | රයිබොෆ්ලේවින් මි.ග්‍රෑ. දිනක | නයැසින් මි.ග්‍රෑ. දිනක | ඇස්කෝබික් ඇසිඩ් මි.ග්‍රෑ. දිනක | ෆෝලික් අම්ලය මයි. ග්‍රෑම් දිනක | විටමින් බී12 මයි. ග්‍රෑම් දිනක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිමි | කය නොවෙහෙසන | 60 | 2475 | [10350] | 53 (45) | 400 | 17 | 600 | 1.2 | 1.5 | 16 | 40 | 200 | 1.0 |
| | මධ්‍යස්ථව කය වෙහෙසන | | 2840 | [11880] | ,, | ,, | ,, | ,, | 1.4 | 1.7 | 19 | ,, | ,, | ,, |
| | අධිකව කය වෙහෙසන | | 3350 | [14010] | ,, | ,, | ,, | ,, | 1.7 | 2.0 | 22 | ,, | ,, | ,, |
| ගැහැණු | කය නොවෙහෙසන | 50 | 1920 | [8030] | 44 (38) | 400 | 19 | 600 | 1.0 | 1.2 | 13 | 40 | 200 | 1.0 |
| | මධ්‍යස්ථව කය වෙහෙසන | | 2020 | [8450] | ,, | ,, | ,, | ,, | 1.0 | 1.2 | 13 | ,, | ,, | ,, |
| | අධිකව කය වෙහෙසන | | 2240 | [9370] | ,, | ,, | ,, | ,, | 1.1 | 1.3 | 15 | ,, | ,, | ,, |
| | ගැබිනි මව්වරු – | | | | | | | | | | | | | |
| | සාමාන්‍ය පරිදි වැඩ කරන | | +285 | [1200] | 7 (6) | 1000 | 23 | 600 | +0.2 | +0.2 | +2 | 40 | 500 | 1.5 |
| | වැඩ අඩුකළ | | +200 | [850] | ,, | ,, | ,, | ,, | +0.1 | +0.2 | +1 | ,, | ,, | ,, |
| | කිරිදෙන මව්වරු – | | | | | | | | | | | | | |
| | මාස 03-06 | | +500 | [2100] | +21 (18) | 1000 | 19 | 950 | +0.3 | +0.3 | +3 | 80 | 250 | 1.5 |
| | මාස 06-12 | | +500 | [2100] | +15 (13) | ,, | ,, | ,, | +0.3 | +0.3 | +3 | 80 | ,, | ,, |
| ළදරු | මාස 03-06 | 7.0 | 700 | [2930] | 27 (13) | 500 | - | 350 | 0.4 | 0.4 | 5 | 25 | 21 | 0.2 |
| | මාස 06-09 | 8.5 | 810 | [3390] | 29 (14) | ,, | - | ,, | 0.4 | 0.5 | 5 | ,, | 26 | ,, |
| | මාස 09-12 | 9.5 | 950 | [3970] | 29 (14) | ,, | - | ,, | 0.5 | 0.6 | 6 | ,, | 29 | ,, |
| ළමයින් | අවුරුදු 1-2 | 11.0 | 1150 | [4810] | 29 (14) | 400 | 7 | 400 | 0.6 | 0.7 | 8 | 40 | 33 | 0.2–1 |
| | අවුරුදු 2-3 | 13.5 | 1350 | [5650] | 30 (15) | ,, | 8 | ,, | 0.7 | 0.8 | 9 | ,, | 41 | ,, |
| | අවුරුදු 3-5 | 16.5 | 1570 | [6570] | 30 (18) | ,, | 10 | ,, | 0.8 | 0.9 | 10 | ,, | 50 | ,, |
| පිරිමි ළමුන් | අවුරුදු 05-07 | 20.5 | 1850 | [7740] | 31 (21) | 400 | 12 | 400 | 0.9 | 1.1 | 12 | 40 | 62 | 0.2–1 |
| | අවුරුදු 07-10 | 27.0 | 2100 | [8790] | 41 (27) | ,, | 16 | 600 | 1.1 | 1.3 | 14 | ,, | 81 | ,, |
| | අවුරුදු 10-12 | 34.5 | 2200 | [9200] | 53 (34) | 600 | 20 | ,, | 1.1 | 1.3 | 15 | ,, | 104 | ,, |
| | අවුරුදු 12-14 | 44.0 | 2400 | [10040] | 67 (44) | ,, | 23 | ,, | 1.2 | 1.4 | 16 | ,, | 132 | ,, |
| | අවුරුදු 14-16 | 55.5 | 2650 | [11090] | 80 (52) | ,, | 29 | ,, | 1.3 | 1.6 | 17 | ,, | 167 | ,, |
| | අවුරුදු 16-18 | 64.0 | 2830 | [11840] | 88 (58) | 500 | 34 | ,, | 1.4 | 1.7 | 19 | ,, | 192 | ,, |
| ගැහැණු ළමුන් | අවුරුදු 05-07 | 20.5 | 1750 | [7322] | 31 (21) | 400 | 12 | 400 | 0.9 | 1.1 | 12 | 40 | 62 | 0.2–1 |
| | අවුරුදු 07-10 | 27.0 | 1810 | [7573] | 41 (27) | ,, | 16 | 600 | 0.9 | 1.1 | 12 | ,, | 81 | ,, |
| | අවුරුදු 10-12 | 36.0 | 1950 | [8160] | 55 (36) | 600 | 21 | ,, | 1.0 | 1.2 | 13 | ,, | 108 | ,, |
| | අවුරුදු 12-14 | 46.5 | 2100 | [8790] | 67 (44) | ,, | 18 | ,, | 1.1 | 1.3 | 14 | ,, | 140 | ,, |
| | අවුරුදු 14-16 | 52.0 | 2150 | [9000] | 72 (47) | ,, | 20 | ,, | 1.1 | 1.3 | 14 | ,, | 156 | ,, |
| | අවුරුදු 16-18 | 54.0 | 2150 | [9000] | 66 (43) | 500 | 21 | ,, | 1.1 | 1.3 | 14 | ,, | 162 | ,, |

* සියළුම වයස් පරාසයන් දී ඇති වයසෙන් ආරම්භව වැඩි අගයට දශම ස්ථානයක් අඩුවෙන් අවසන් වේ. (උදා. මාස 6 - මාස - 3-5.99)

** වයස් පරාසවල මධ්‍ය අගයට අදාල ශරීරයේ බර (එන්සිඑච්එස්)

†† වරහන්තුල දී ඇත්තේ ජීව අගයෙන් උසස් ප්‍රෝටීන් සඳහා වන අගයන් වේ. උදා. බිත්තර ප්‍රෝටීන්

** ප්‍රධාන ආහාරය ලෙස බත් අනුභව කරනවිට යකඩ අවශෝෂණය වන ප්‍රමාණ මත පදනම්ව ගණන් ලබා ඇත.
අදාල ප්‍රමාණය : වැඩිහිටි පිරිමි, ළමුන් හා යෞවනෝදයේ පිරිමි ළමුන් සඳහා 5%, යෞවනෝදයේ ගැහැණු ළමුන්, වැඩිහිටි හා කිරිදෙන මව්වරුන් සහා 8% ගැබිනි මව්වරුන් සඳහා 13.3%

ලෝක සෞඛ්‍ය සංවිධානයේ 1985 නිර්දේශයන් මත පදනම් වේ.
(යකඩ සඳහා වූ නිර්දේශයන් වෛද්‍ය පර්යේෂණ සඳහා වූ ඉන්දියානු සභාවේ නිර්දේශ මත පදනම් වේ.)

## උපලේඛනය V

පැහැදිලි කිරීම

(අ) පෝෂණ හිමිකම

(i) ආහාරයක පෝෂණ මට්ටම විස්තර කරන පෝෂණ හිමිකම පෝෂණ අන්තර්ගතය ලෙස සලකනු ලැබේ. (උදා - "කැල්සියම් මූලාශ්‍රය" "කෙඳි බහුලව අඩංගුය" "මේදය අඩුවෙන් අන්තර්ගත වී ඇත.") සංසන්දනාත්මක හිමිකම යනු ආහාර වර්ග දෙකකට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පෝෂණ මට්ටම් සහ/හෝ ශක්ති අගය සංසන්දනය කරනු ලබන හිමිකමකි (උදා : අඩුකල, වඩාඅඩු, වඩා ස්වල්ප, වැඩි කළ, වඩා වැඩි).

(ii) පෝෂණ ක්‍රියාකාරී හිමිකම යනු ශරීරයේ වර්ධනය, සංවර්ධනය සමඟ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කායිකව කාර්‍යභාරය විස්තර කරනු ලබන පෝෂණ හිමිකමකි. (උදා - "ශක්තිමත් දත් සහ අස්ථි වර්ධනයට කැල්සියම් උපකාරී වේ") "ශරීරයේ පටක තැනීමට සහ ඒවා අළුත්වැඩියා කිරීමට ප්‍රෝටීන් උපකාරී වේ" "රතු රුධිර සෛල සෑදීමට යකඩ අත්‍යාවශ්‍යය."

"විටමින් ඊ ශරීරයේ පටකවල මේදය ඔක්සිකරණයවීමෙන් වළකයි. "ෆේලික් අම්ලය අන්තර්ගතයි." - "කලලයේ සාමාන්‍ය වර්ධනයට ෆෝලික් අම්ලය උපකාරී වේ."

(ආ) පෝෂණ අන්තර්ගතය පිළිබඳ හිමිකමක් ඉදිරිපත් කළ විට ඒ සඳහා 'අ' වගුවේ ඇති කොන්දේසිවලට අනුකූලව විය යුතුය.

(ඇ) යම් ආහාරයක පෝෂක පිළිබඳ හිමිකම් පෑමේදී එම ආහාරය ස්වභාවයෙන්ම පෝෂක අඩුනම් හෝ කිසිවක් නොමැතිනම් ආහාරයේ නමට ආසන්නයෙන්ම ඉදිරියෙන් පෝෂණ මට්ටම දැක්වෙන පදය නොයෙදිය යුතු අතර ඒ වෙනුවට "(පෝෂකයේ නම) අඩු ආහාරයකි." හෝ එසේත් නොමැති නම් "(පෝෂකයේ නම) තොර ආහාරයකි" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඈ) පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් ශරීරයේ පෝෂණ ක්‍රියාකාරිත්වයට අදාළ පෝෂණ ක්‍රියාකාරී හිමිකම් සඳහා අවසර දෙනු ලැබේ.

(i) මෙම නියෝගවල IV වැනි උපලේඛනය යටතේ පෝෂක නිර්දේශ වටිනාකම ස්ථාපිත කර ඇති අත්‍යාවශ්‍ය පෝෂක පමණක් වීම.

(ii) පෝෂණ හිමිකම දක්වන ලද ආහාරය ඒ සඳහා වන පෝෂණ මූලාශ්‍රයක් වීම.

(iii) පෝෂණ ක්‍රියාකාරී හිමිකම ප්‍රධාන ආහාර බලධරයාගේ අනුමැතිය සහිතව විද්‍යාත්මක එකඟත්වයක් මත පදනම් වීම.

(iv) රෝගයකට ප්‍රතිකාරයක් වශයෙන් හෝ රෝගයකින් ආරක්ෂා වීමට එම පෝෂකය උපකාරවන බවට හැඟවෙන කවර හෝ ප්‍රකාශයක් එහි ඇතුළත් නොවීම.

'අ' වගුව

13(3) වැනි වගන්තිය

| උපාංගය | හිමිකම | කොන්දේසි<br>වඩා වැඩි නොවිය යුතු ප්‍රමාණය |
|---|---|---|
| ශක්තිය | අඩු | 40 කි. කැ. (170 කි. ජු/100 ග්‍රෑ (ඝණ ආහාර) හෝ<br>20 කි. කැ. (85 කි. ජු.)/100 මිලි (දියර) |
| | රහිත | 4 කි. කැ./100 මි. ලී. (දියර) |
| මේදය | අඩු | 3 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර)<br>1.5 ග්‍රෑ/100 මි. ලී. (දියර) |
| | රහිත | 0.5 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර) හෝ 100 මි. ලී. (දියර) |
| සංතෘප්ත මේදය | අඩු | 1.5 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර)<br>0.75 ග්‍රෑ/100 මිලි (දියර) හා 10% හා ශක්තිය |
| | රහිත | 0.1 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර)<br>0.1 ග්‍රෑ/100 මි. ලී. (දියර) |
| කොලොස්ටරෝල් | අඩු[1] | 0.02 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර) සහ 1.5 ග්‍රෑම් සන්තෘප්ත මේදය/100 ග්‍රෑ (ඝණ ආහාර)<br>0.01 ග්‍රෑ/100 මි. ලී. (දියර) සහ 0.75 සන්තෘප්ත මේදය/100 මි. ලී. (දියර) සහ සන්තෘප්ත මේදයේ ශක්තියෙන් 10% |
| | රහිත | 0.005 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර) සහ 1.5 ග්‍රෑ සන්තෘප්ත මේදය/100 මි. ලී. (දියර)<br>0.005 ග්‍රෑ/100 මි. ලී. (දියර) සහ 0.75 ග්‍රෑ. සන්තෘප්ත මේදය/100 මි. ලී. (දියර) සහ සන්තෘප්ත මේදයෙන් ශක්තියෙන් 10% |
| සීනි | රහිත | 0.5 ග්‍රෑ/100 ග්‍රෑ (ඝණ ආහාර), 0.5 ග්‍රෑ/100 මි. ලී. (දියර) |
| සෝඩියම් | අඩු | 0.12 ග්‍රෑ/100 ග්‍රෑ |
| | ඉතා අඩු | 0.04 ග්‍රෑ/100 ග්‍රෑ |
| | රහිත | 0.005 ග්‍රෑ/100 ග්‍රෑ. |

[1] හිමිකම්පෑමක් සම්බන්ධයෙන් වන විට අදාළ අවස්ථාවන්හි දී "සන්තෘප්ත මේදය අඩුවීම" "ට්‍රාන්ස් ෆැට් අම්ල" සැළකිල්ලට ගත යුතු ය. "කොලොස්ටරෝල් අඩු" සහ "කොලොස්ටරෝල් රහිත" බවට හිමිකම් පාන ආහාර සම්බන්ධයෙන් මෙම විධිවිධාන අදාළ විය යුතු ය.

02-91

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.